**ගොඩකවෙල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2020 මැයි 26 දින වනවිටත් ගිවිසුම්ගතව නොතිබුණු කර්මාන්තයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 2,959,079 ක ණයහිමි වෙන්කිරීම් සිදුකර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | අදාල කර්මාන්ත සඳහා සීමිත මිල කැඳවීම් යටතේ මිල ගණන් ලබාගෙන ඇති බවත්, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සඳහා පළාත් පාලන ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු සිදුකරන බවත් දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල සිදුකරන ලද, වටිනාකම රු. 2,108,635 ක් වූ කර්මාන්ත 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වර්ෂයට අදාල ජංගම නොවන වත්කම් වැඩිවීම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ප්‍රාග්ධනිත කරන බව දන්වමි. |
| (ඇ) | කසළ ද්‍රව්‍ය ගබඩා කිරීමේ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් පිරිවැය ප්‍රාග්ධනිත කර තිබියදී ගෙවන ලද අත්තිකාරම් රු. 550,000 ක්ද, ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | කර්මාන්තයට අදාල වියදම හා අත්තිකාරම් පියවීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ව්‍යාපෘතියේ වැඩ අවසන් කර අවසන් ගෙවීමේ දී සියළුම ගෙවීම් අඩුකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉකුත් වර්ෂවලට අදාල ණයගිම් අධි වෙන්කිරීම් රු. 306,383 ක් ගිණුම්වලට ගලපා නොතිබුණි. | ණයගිම් අධි වෙන්කිරීම් සමුච්චිත අරමුදලට බැර කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී ණයගිම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | බැංකු ශේෂ තහවුරුකිරීම් වලට අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට ස්ථාවර තැන්පතු වටිනාකම රු. 12,877,742 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු. 12,570,092 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු. 307,650 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන අගයන් තහවුරු ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අදාල වැරදි නිවැරදි කර ගිණුම් පිළියෙල කරන ලෙසට විෂයය නිලධාරිනියට උපදෙස් දුන් බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | එකතුව රු. 734,779 ක් වූ ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේ දී මෙම ගැටළුව විසඳා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.3 ඡේදය | ඉදිරිපත් කරන ලද මිල ගණන් වල සාධාරණත්වය සම්බන්ධයෙන් සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබා ගැනීමෙන් තොරව රු. 707,290 ක් වැයකර බැකෝ යන්ත්‍රයක් හා කැබ් රථයක් අළුත්වැඩියා කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි අළුත්වැඩියා කටයුතු වලදී මිල ගණන්වල සාධාරණත්වය පිළිබඳ වාර්තාවන් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,637,639 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,754,407 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,177,172 | 6,112,142 | 6,283,514 | 3,095,327 | 6,853,464 | 6,474,707 | 6,000,039 | 3,821,378 |
| කුලී | 10,287,881 | 9,193,405 | 9,173,523 | 572,020 | 7,682,640 | 8,293,506 | 8,175,115 | 269,543 |
| බලපත්‍ර ගාස්තු | 1,815,200 | 1,580,136 | 1,590,598 | - | 1,611,200 | 1,821,562 | 1,819,199 | - |
| වෙනත් ආදායම් | 23,589,982 | 23,896,676 | 35,474,542 | 19,364,418 | 12,948,536 | 13,881,927 | 29,884,906 | 14,761,666 |
| | 41,870,235 | 40,782,359 | 52,522,177 | 23,031,765 | 29,095,840 | 30,471,702 | 45,879,259 | 18,852,587 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 2,857,308 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 03 ට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු. 1,330,680 ක් ඇතුලත් වී තිබුණි. එම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය තුල ජංගම වැඩසටහන් හා දේපල තහනම් කිරීම් මඟින් හිඟයෙන් කොටසක් අයකරගත් බවත්, ඉතිරි හිඟ ශේෂය අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 2.2.3 කඩකුළී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩකාමර 03 කට අදාලව වසර 05 ට වඩා වැඩි කාලයක සිට හිඟහිට ඇති රු. 100,063 ක් අයකරගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීමටත්, අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | මෙම කඩ කාමරවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට හැකියාවක් නොමැති වූ බැවින් මහා සභාවට යොමුකර එම මුදල පොතෙන් කපා හැරීමට යෝජනා සම්මත කර ඇති බවත්, එම තීරණය ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත් දන්වමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බවට හඳුනාගෙන තිබූ උසාවි දඩ රු. 8,312,159 ක් වූ අතර, මුද්දර ගාස්තු රු. 8,577,052 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මුද්දර ගාස්තු මේ වනවිට ලැබී ඇති බවත්, උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5 බලපත්‍ර ගාස්තු**

**පරිසර බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පරිසර බලපත්‍ර ලබාගත යුතු යැයි හඳුනාගත් ආයතන 10 ක් බලපත්‍ර ලබා ගෙන නොතිබූ අතර, 2018 හා 2019 වර්ෂයේදී අළුත් කලයුතු පරිසර බලපත්‍ර 09 ක් අළුත්කර නොතිබීම හේතුවෙන් සභාවට රු. 76,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත නියමිත ක්‍රියාපටිපාටියට අනුකූලව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ සමීක්ෂණ අනුව පරිසර බලපත්‍ර ලබා ගන්නා ලෙස අදාල ව්‍යාපාරිකයින්ට දැනුම් දුන් බව දන්වමි. |

**2.3 දැන්වීම් පුවරු ආදායම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් පුවරු හඳුනාගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර, ස්ථිර දැන්වීම් පුවරු 03 කට අදාලව අයවියයුතු රු. 81,487 ක් අයකර ගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකිරීම සම්බන්ධව මේ වනවිට කිහිපවරක් අදාල ආයතන වෙත ලිපි යොමුකර ඇති බවත් හිඟ ශේෂ ඉක්මනින් අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, බල ප්‍රදේශයේ සංවර්ධනය හා ජනතාවට සපයන සුහසාධන පහසුකම් ඉහල නැංවීම පිළිබඳ යෝජනා කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට බල ප්‍රදේශයට අදාල සංවර්ධන යෝජනා සහ සුභ සාධන සේවාවන් ඇතුලත් කර සකස් කර ඇති බව දන්වමි. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | 2020 වර්ෂයේ තිරසර සංවර්ධන සැලැස්ම සකස් කර ඇති බව දන්වමි. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවය අත්හිටවීම, සේවයෙන් ඉවත්වීම, මියයාම හා ස්ථාන මාරුවීම හේතුවෙන් වසර 02 ත් 20 ත් අතර කාලයක සිට හිඟහිට ඇති නිලධාරීන් 05 දෙනෙකුට අදාල එකතුව රු. 61,798 ක් වූ හිඟ ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | අදාල ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 04 ක් ඉවත්කිරීමට හෝ නියමානුකූල කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කළ යුතුවේ. | හඳුනාගත් අනවසර ඉදිකිරීම් වල හිමිකරුවන් වෙත අදාල අනවසර ඉදිකිරීම් නීත්‍යානුකූල කර ගන්නා ලෙස දන්වා යවා ඇති බවත් ඔවුන් විසින් මේ වනවිට ඒ සඳහා අවශ්‍ය අයදුම්පත් මිලදී ගෙන ඇති බවත් දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අළුත්වැඩියා කලයුතු තත්ත්වයේ පවතින වසර 03 කට වැඩි කාලයක් ධාවනයේ යොදවා නොතිබූ ට්‍රැක්ටර් රථ දෙකක් අළුත්වැඩියා කර නොතිබූ අතර, ඉන් එක් ට්‍රැක්ටරයකට 2018 මැයි මස රු. 27,300 ක් වැයකර මීටර් පුවරුවක් පමණක් සවිකර තිබුණි. | වාහන අළුත්වැඩියා කටයුතු යාවත්කාලීනව සිදුකළ යුතුවේ. | ට්‍රැක්ටර් දෙක සඳහා අවශ්‍ය කරන අමතර කොටස් වෙළඳපොලේ නොතිබුණු බැවින් අළුත්වැඩියා කිරීමට නොහැකි වූ බවත්, දැනට එම අමතර කොටස් වෙළඳපොලේ ඇති බැවින් අළුත්වැඩියා කටයුතු සිදු කරන බවත් දන්වමි. |
| (ආ) | ධාවනයෙන් ඉවත් කළ කැබ් රථයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නිෂ්ක්‍රීය වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | අපහරණය කළයුතු කැබ් රථය සඳහා පත් කරන ලද සමීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියා නම් කර එවූ පසු අපහරණ කටයුතු සිදු කරන බව දන්වමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 මාර්තු මස රු. 84,000 ක් වැයකර මිලදීගත් කසළ බහාලුම් කවර 3000 ක් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ ආයතනයක් | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ආර්ථික බව සහ ඵලදායීත්වය පිළිබඳ | කවර මුද්‍රණය කර දීමට නම් අවම වශයෙන් කවර 7000 කට වඩා මිලදී ගතයුතු බව අදාල |

| | | | |
|---|---|---|---|
| | වෙත රු. 195,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව එහි මුළු වියදම රු. 279,000 ක් විය. එහෙත් 2019 අප්‍රේල් මස මුද්‍රිත කවර 9000 ක් රු. 292,500 කට එම ආයතනයෙන්ම මිලදී ගෙන තිබුණි. ඒ අනුව සැලසුම්සහගතව කටයුතු කර නොතිබීම හේතුවෙන් මාර්තු මස කසළ බහාලුම් කවර මිලදී ගැනීමේදී රු. 181,500 ක පාඩුවක් සිදුව තිබුණි. | අවධානය යොමුකර සැලසුම්සහගතව කටයුතු කළ යුතුවේ. | ආයතනය පැවසූ බැවින් මුල් අවස්ථාවේදී මුද්‍රණ කටයුතු වෙනත් ආයතනයකින් සිදුකර ගැනීමට සිදුවූ බවත් පසුව කවර වැඩි ප්‍රමාණයක් අවශ්‍ය වූ නිසා මුද්‍රණය කළ කවර අවම මිලකට මුල් ආයතනයෙන්ම මිලදී ගැනීමට කටයුතු කළ බවත් දන්වමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**නොවිසඳී ඇති නිරීක්ෂණ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හිඟ කඩ කුලී හේතුවෙන් රක්වාන වෙළඳ සංකීර්ණයේ කඩකාමර 02 ක් 2007 හා 2015 වර්ෂ වල සභාව වෙත ආපසු පවරාගෙන තිබුණ ද එදිනට පැවති හිඟ කඩ කුලිය රු. 78,285 ක් අයකර ගැනීමට හෝ බදුකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීමටත්, අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | මෙම කඩ කාමරවල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට හැකියාවක් නොමැති වූ බැවින් මහා සභාවට යොමුකර එම මුදල පොතෙන් කපා හැරීමට යෝජනා සම්මත කර ඇති බවත්, එම තීරණය ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත් දන්වමි. |
| (ආ) | දීර්ඝ කාලයක සිට නොපියවූ අත්තිකාරම් වල ඇතුලත් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ගෙවූ රු. 37,866 ක අධිභාර මුදලට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිභාර මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සහා අනුමැතිය ලබා ගත් බවත් එය පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බවත් දන්වමි. |
| (ඇ) | සභාව සතු ගොඩනැගිලි හා සුසාන භූමි සඳහා වෙන්කර ඇති ඉඩම් 37 ක අයිතිය විධිමත්ව පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | ප්‍රාදේශීය ලේකම් සමඟ සාකච්ඡා කර ඉඩම් අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් වෙත කිහිපවරක් ඉල්ලීම් කලද මේ වන තෙක් එම සුසාන භූමිවල අයිතිය පවරා දී නොමැති බව දන්වමි. |